Equalities In Health

NHS Greater Glasgow and Clyde

# මාතෘ සත්කාරය ලබා ගැනීමට ඔබට ඇති අයිතීන්



## පියවරෙන් පියවර මාර්ගෝපදේශයක්

NHS Greater Glasgow & Clyde උසස් තත්ත්වයේ මාතෘ සත්කාර සැපයීමට සහ අප වෙත පැමිණෙන සෑම කෙනෙකුටම සාධාරණව හා ගෞරවයෙන් සැලකීමට කැපවී සිටියි.

අපගේ ඕනෑම සේවාවක් භාවිතා කරන විට ඔබට හිමි වන අයිතීන් ප්‍රමාණයක් ඇත.

උදාහරණයක් ලෙස, ඔබට ජාතිවාදය හෝ වෙනත් ආකාරයේ වෙනස් කොට සැලකීමකට බඳුන් නොවී සිටීමට අයිතියක් ඇත.

සත්කාරය ලබා ගන්නා අතර ඔබට උපකාර කිරීමට පුණ්‍යායතනයක කෙනෙකු වැනි ස්වාධීන සහය ලබා ගැනීමට ඔබට අයිතියක් ඇත.

අපගේ පියවරෙන් පියවර මාර්ගෝපදේශය ගර්භණී සමයේදී සහ ඉන් පසුව ඔබට ලැබෙන සත්කාරයේ විවිධ අවස්ථා පැහැදිලි කරයි. අපගේ සේවාවන් භාවිතා කරන අතරතුර භාෂණ පරිවර්තන සහය ලබා ගැනීම සඳහා ඇති අයිතිය, වැදගත් දුරකථන අංක ඇමතීම සඳහා අපගේ දුරකථන භාෂණ පරිවර්තන සේවාව ලබා ගන්නා ආකාරය යනාදිය මෙයට ඇතුළත් වේ.

පියවර 1

# මාතෘ සත්කාරය සඳහා වේලාව වෙන් කරගැනීම

ඔබ ගැබ්ගත් බව දැනගත් වහාම වේලාව වෙන් කරගැනීමේ කාර්යාලය අමතා වින්නඹු මාතාවක් සමග වේලාවක් වෙන් කරගන්න.

ඔබගේ ගැබ්ගැනීමේ සති 6 සහ 10 අතර ඔබගේ දේශීය මාතෘ සේවා සඳහා වේලාව වෙන් කරවා ගන්නා ලෙස අපි, ගැබිණි පව්වරුන්ගෙන් සහ දැනටමත් දරුවන් සිටින සියලුම මව්වරුන්ගෙන් ඉල්ලා සිටිමු.

ඔබේ ගර්භණී කාලයේ මුල් අවධීන් තුළ ඔබ සහ ඔබේ දරුවා හොඳින් පසුවන්නේදැයි පරීක්ෂා කිරීමට සෞඛ්‍ය පරීක්ෂණ සහ ස්කෑන් පරීක්ෂණ සිදු කරන බැවින් කළින්ම එසේ වේලාව වෙන් කරගැනීම සහ සියලුම වෙන් කරගැනීම්වලට සහභාගි වීම වැදගත් වේ. වින්නඹු මාතාව ඔබේ තත්ත්වය තේරුම් ගැනීම සඳහා ඔබට උපකාර කරනු ඇති අතරම ගැබිණි කාලය තුළ ඔබට අවශ්‍ය විය හැකි අතිරේක සහය සහ සත්කාරය සම්බන්ධව සාකච්ඡා කරනු ඇත.

වේලාව වෙන් කරගැනීමේ කාර්යාලයේ අංකය වන්නේ
**0141 347 8422**

මෙම ඇමතුම ලබාගැනීමට ඔබට අපගේ දුරකථන භාෂණ පරිවර්තන සේවාව භාවිතා කළ හැකි ය.

මේ සඳහා සහ වෙනත් සියලුම ඉදිරි වේලාව වෙන් කරගැනීම් සඳහා
භාෂණ පරිවර්තන සේවාව ලබා ගැනීමට ඔබට කාර්ය මණ්ඩලය ඇමතීමට ඔබට අයිතිය ඇත.

පියවර 2

# වේලාව වෙන් කරගැනීම් සඳහා සහභාගි වීම

ඔබට විශ්වාසය ගොඩනගා ගැනීමට සහ සන්නිවේදනය සඳහා උපකාර කිරීමට, ඔබේ ප් රසව ප් රතිකාර අතරතුර ඔබට වින්නඹු මාතාවන් 1 කෙනෙකු හෝ 2 දෙදෙනකු පමණක් මුණ ගැසෙනු ඇත. පවසන දෙයින් කිසිවක් ඔබට පැහැදිලි නොමැති නම් ඒ සම්බන්ධව ප් රශ්න ඇසීමට සහ
පැහැදිලි කිරීමක් ඉල්ලා සිටීමට ඔබට අයිතිය ඇත.

පළමු මුණ ගැසීමේදී, වින්නඹු මාතාව, ප් රශ්න ඇසීමට ඔබට පුද්ගලික වේලාවක් ලබා දීම පිණිස ඔබ සමග පැමිණෙන සහකරුවෙකු ෙහා් සහායකෙයකුගෙන් මිනිත්තු කිහිපයක් පිටතට යන ලෙස ඉල්ලා සිටිනු ඇත. මෙය ගැබිණි මාතාවන් සම්බන්ධව සම්මත ක් රමය වේ.

ඔබට ඔබෙග් නිවසට ආසන්න ස්ථානයක සත්කාරය ලැබිය හැකි ය. ඔබ සමාජ ආරක්ෂණ ප් රතිලාභ සහිතව සිටින්නේ නම්, ඔබට ඔබේ ප් රවාහන වියදම් සඳහා හිමිකම් ලබාගත හැකි ය. ඔබ Best Start Grant, Best Start Foods සහ Scottish Child Payment සඳහා ද යෝග් ය විය හැකි ය. මේ පිළිබඳව ඔබට කාර්ය මණ්ඩල සාමාජිකෙයකුගෙන් දැනගත හැකිය. ඔබෙග් වේලාව වෙන් කරගැනීම්වලට පැමිණීමට ගැටළුවක් ඇති නම් කරුණාකර ඔබේ වින්නඹු මාතාව සමග සාකච්ඡා කරන්න.

ඔබට ඔබ කැමති භාෂාවෙන් සියලු තොරතුරු ලබා ගැනීමට ඔබට අයිතිය ඇත. ගර්භණී කාලය තුළ ඔබ සහ දරුවා පිළිබඳව සැලකිලිමත් විය යුතු ආකාරය, ඔබට ලැබෙන පරීක්ෂණ පිළිබඳ තොරතුරු සහ දරු උපත සඳහා සූදානම් වීම යනාදිය මෙයට ඇතුළත් ෙව්. ඔබේ දරුවා රැකබලා ගැනීම සහ පෝෂණය කිරීමේ විකල්ප සැලසුම් කිරීම ද එයට ඇතුළත් වේ. පූර්ව ප් රසව කාල සීමාව තුළ ඔබේ වින්නඹු මාතාව ඔබ සමග මෙය සාකච්ඡා කරනු ඇත. ඔබට මෙම තොරතුරු ලැබී නැති බව හැඟේ නම්, කරුණාකර කාර්ය මණ්ඩලයේ සාමාජිකෙයකුගෙන් එය විස්තර කරන මෙන් ඉල්ලා සිටින්න.

පියවර 3

# පූර්ව ප්‍රසව පංති

පූර්ව ප්‍රසව පන්ති මගින් දරු ප්‍රසූතිය සඳහා සූදානම් වන ආකාරය, ඔබට අවශ්‍ය විය හැකි දේ, ඔබ ඔබේ දරුවාට පෝෂණය කරන ආකාරය සහ ඔබ පිළිබඳව සැලකිලිමත් විය යුතු ආකාරය වැනි වැදගත් කරුණු ආවරණය කරයි.

මෙම පංතිවලට සහභාගි වීමේදී භාෂණ පරිවර්තකයෙකු ලබා ගැනීමට ඉල්ලා සිටිය හැකි ය.

භාෂණ පරිවර්තකයා ඔබ අසල වාඩිගෙන එහිදී පවසන දෙය සෙමින් ඔබට පරිවර්තනය කරදෙන අතර ඔබට ඇති ප්‍රශ්න ද පරිවර්තනය කරයි. ඔබේ සහකරු / සහායකයා හට ද මෙම පූර්ව ප්‍රසව පංති සඳහා සහභාගි විය හැකි ය.

ගර්භණී සමයේදී, දරු ප්‍රසූතියේදී සහ දරුවා බිහිවීමෙන් පසු ඔබට උපකාර කරන්නේ කෙසේද යන්න පිළිබඳ තොරතුරු සහ උපදෙස් ඔවුන්ට ලැබෙනු ඇත. ඔබේ දරුවා රැක බලා ගන්නා ආකාරය පිළිබඳව කුසලතාවයන් ද ඔවුන් ඉගෙන ගනු ඇත. දරුවා බිහි කිරීමෙන් පසු පවුල් සැලසුම් කිරීම පිළිබඳ තොරතුරු ද ලද හැකි ය.

පියවර 4

# උපත් සැලසුමක් සැකසීම

ඔබ ඔබේ වින්නඹු මාතාව සමග ඔබේ උපත් සැලසුම සාකච්ඡා කළ යුතු ය. දරුවා ප්‍රසූත කරන විට ඔබ සමග සිටිය යුතු පුද්ගලයා මෙන්ම ජලයේදී දරුවා බිහි කිරීම, නිවසේදී බිහි කිරීම, වේදනා සහන, ආහාර සහ භාෂණ පරිවර්තන සහය වැනි ඔබේ මනාපයන් ද මෙයට ඇතුළත් විය හැකි ය.

ඔබ ප්‍රසවයේ පසුවන විට වෛද්‍ය ගැටලු හේතුවෙන් කාර්ය මණ්ඩලයට සැමවිටම ඔබේ මනාපයන් අනුගමනය කිරීමට නොහැකි විය හැකි නමුත් මෙය ඔබට පැහැදිලි කර දිය යුතු ය.

ඔබේ දරු ප්‍රසූතිය ප්‍රේරණය කිරීමට (වෛද්‍යමය ලෙස ආරම්භ කිරීමට) සිදු විය හැකි ය. සමහර කාන්තාවන්ට සිසේරියන් දරු උපතක් සිදු කිරීමට අවශ්‍ය විය හැකි ය. ඔබේ වින්නඹු මාතාවට ඔබට මෙම ක්‍රියාවලීන් පැහැදිලි කිරීමට සහ ඔබට ඇති ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු දීමට හැකි ය.

පියවර 5

# ඔබේ දරුවා ලැබීම

බොහෝ කාන්තාවන් තම දරුවා රෝහෙල්දී ලැබීමට අදහස් කරයි. ඔබ ප් රසව වේදනාවන් අත් විඳින බව සිතන්නේ නම්, කරුණාකර ඔබ වේලාව වෙන් කරගත් රෝහල අමතන්න -

Princess Royal Maternity Hospital
**0141 201 3453/3454**

Queen Elizabeth Maternity Hospital
**0141 232 4363**

Royal Alexandra Community Maternity Unit
**0141 314 7033**

Royal Alexandra Maternity Unit Labour Ward
**0141 314 6067**

Vale of Leven Community Maternity Unit පෙ.ව.8-ප.ව.8* **01389 817232**

Inverclyde Community Maternity Unit පෙ.ව.8-ප.ව.8* **01475 504619**

*රාජකාරි වේලාවෙන් පිටත ඇමතුම් Roya Alexandra Hospital Labour Ward on **0141 314 7033**

සිදුවන දේ පිළිබඳව වින්නඹු මාතාව ඔබට පවසනු ඇති අතර ඊළඟට කළ යුතු දේ සම්බන්ධව උපෙදස් ලබා දෙනු ඇත.
ඔබට මේ සඳහා අපෙග් දුරකථන භාෂණ පරිවර්තන සේවාව භාවිතා කළ හැකි ය.

ඔබ දරු ප් රසූතිය සිදු කරන විට, වේදනා සහනය ද ඇතුළුව ගන්නා සියලු තීරණ සමග සම්බන්ධ වීමට ඔබට අයිතිය ඇත. ඔබට අවශ් ය ප් රමාණෙයන් වේදනා සහනය නොලැබෙන බව ඔබට දැනෙන්නේ නම්, කරුණාකර පැමිණ සිටින කාර්ය මණ්ඩල සාමාජිකයාට ඒ බව පවසන්න නැතෙහාත් ඔබ කැමති වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකෙයකුට කථා කරන්න.
ඔබට ඔබේ දරු ප් රසූතිය අතරතුර භාෂණ පරිවර්තන සහය ඉල්ලා සිටිය හැකි ය.

පියවර 6

# පශ්චාත් ප්රසව සත්කාරය

ඔබ දරුවා ලැබීමෙන් පසු රෝහලේ සිටින්නේ නම්, ඔබට වින්නඹු මාතාවන් සහ වෛද්යවරුන් සමග ඔබේ සත්කාරයේ ප්රධාන කරුණු ප ළිබඳව කථා කිරීමට භාෂණ පරිවර්තන සහය ලබා ගැනීමට අයිතිය ඇත.

ඔබේ දරුවා පෝෂණය කිරීමට සහ ඔබ තෝරාගත් ආකාරයෙන් ඔබ ගැන සොයා බැලීමට ඔබට සැමවිටම සහාය ලැබිය යුතුය. ඔබ නිවසේ සිටින විට, ඔබේ දරුවා ලැබී දින 10ක් ගතවන තෙක් වින්නඹු මාතාවක් ඔබ වෙත පැමිණෙනු ඇත. දින 11-14 දක්වා සෞඛ්ය සේවකයෙකු ඔබ හමුවීමට පැමිණිය යුතු ය. ගර්භණී භාවයේ පසු අවස්ථාවේදී ද ඔබව දැනගැනීමට සහ සියල්ල හොඳින් සිදුවන්නේදැයි බැලීමට ඔවුන් ඔබ හමුවීමට පැමිණෙනු ඇත.
ළදරු එන්නත්කරන සායන වැනි දේ පිළිබඳව එම සෞඛ්ය සේවකයා ඔබට පවසනු ඇත.
මෙම සංචාරයන් සඳහා භාෂණ පරිවර්තන සහායද ලබා ගත හැකි ය.



## ඕනෑම NHS සේවාවකට ඇමතුමක් ගැනීමට අපගේ දුරකථන භාෂණ පරිවර්තන සේවාව භාවිතා කරන්න.

දුරකථනය 0141 319 4766
ඔබගෙන් රෝගී පි න් අංකය විමසනු ඇත. මෙය 182987 වේ.
එවිට ඔබ තත්පර15 ක් තරම් කෙටි කාලයක් තුළ භාෂණ
පරිවර්තකයෙකුට සම්බන්ධ කෙරෙනු ඇත.
ඔබ ඇමතීමට අදහස් කරන අංකය කුමක්දැයි භාෂණ පරිවර්තකට
පවසන්න, උදාහරණයක් ලෙස 0141 347 8422 (මාතෘ වෙන්කරවා
ගැනීම)
ඔබට NHS24 (111) ද ඇතුළුව අපගේ ඕනෑම සේවාවකට සහ හදිසි
අවස්ථා සේවාවන්ට (999) ඇමතීමට මෙම සේවාව භාවිතා කළ හැකි ය.



## ඔබේ වේලා වෙන්කරගැනීම්වලදී භාෂණ පරිවර්තන සහයක් අවශ්‍ය බව

කාර්ය මණ්ඩල සේවකයෙකුට දන්වන්න. මෙය මුහුණට මුහුණ
පරිවර්තකයෙකු හෝ දුරකථනය හරහා සිදුවන භාෂණ පරිවර්තන සේවයක් විය හැකි ය.
මුහුණට මුහුණ ලා සිටින භාෂණ පරිවර්තකයෙකු භාවිතා කරන්නේ නම් ඔබට අවශ්‍ය
වන්නේ කාන්තා හෝ පිරිමි පරිවර්තකයෙකුද
යන්න දක්වා ඉල්ලා සිටිය හැකි නමුත්, ඔවුන් සැම විටම ලද නොහැකි විය හැකි ය
ඒ සඳහා තදබල අවශ්‍යතාවයක් පවතින්නේ නම්, ඔබට වැඩි කාලයක් රැඳී සිටීම
හැකි ය.
NHSGGC ප්‍රතිපත්තිය වන්නේ ඔබට සහය වීම පිණිස, පවුලේ සාමාජිකයන් හෝ මිතුරන්
යොදා ගැනීම නොව වෘත්තීය භාෂණ පරිවර්තකයෙකු යොදා ගැනීම බව කරුණාවෙන්
සලකන්න.

## ඔබට ලබා දෙන සත්කාරය පිළිබඳව පැමිණිලි කිරීමට අවශ්‍ය නම් කළ යුතු දේ

රෝගී උපදෙස් සහ සහය සේවාව ඔබට ප්‍රතිපෝෂණය ලබා දීමට,
අදහස් දැක්වීමට, ගැටළු සම්බන්ධව අදහස් දැක්වීමට හෝ ඔබට NHS විසින් ලබාදෙන
ප්‍රතිකාර සම්බන්ධව පැමිණිලි කිරීමට උපකාර කරයි.
0800 917 2127 ඔස්සේ අප අමතන්න. මෙම ඇමතුම
ලබා ගැනීමට ඔබට අපගේ දුරකථන භාෂණ පරිව
සේවාව





## හදිසි අවස්ථාවකදී කළ යුතු දේ

යෝනි මාර්ගයෙන් රුධිර වහනයක් හෝ යටි බඩ පෙදෙසේ වේදනාවක් ඇති පමණින් ඔබට ගබ්සාවක් සිදු වන බවක් හැඟවෙන්නේ නැත; සමහර විටෙක ගර්භණී භාවයේ මුල් සති 12 තුළ යෝනි මාර්ගයෙන් සුළු රුධිර වහනයක් සිදු වීම
සාමාන්‍යයකි. මෙය ගබ්සා තර්ජනයක් ලෙස හැඳින්වේ. බොහෝ කාන්තාවන්ට සෞඛ්‍ය සම්පන්න ගර්භණීභාවයක් තිබෙන නමුත් සමහර කාන්තාවන්ට පසුකාලීනව ගබ්සා වීමක් සිදු විය හැකි ය.
ඔබ ගැබ්ගෙන සති 12ට අඩු නම් සහ උදරයේ වේදනාවක් හෝ ලේ ගැලීමක් ඇත්නම් ළඟම ඇති හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර අංශය වෙත යන්න.
පහත සඳහන් අවස්ථාවක් උද්ගත වුවහොත් ඔබ ආසන්නතම හදිසි ප්‍රතිකාර අංශයට යා යුතු ය, නැතහොත් ගිලන් රථයක් ඇමතිය යුතු ය (999)

- ඉතා තදබල උදරයේ වේදනාවක් (එක් පසෙක පමණක් විය හැකි ය) දැනීම
- උරහිස් වේදනාවක් වර්ධනය වීම
- පෙරට වඩා වැඩි වශයෙන් රුධිර වහනයක් සිදුවන්නේ නම් (ලේ කැටි වහනය වීම හෝ මිනිත්තු 30 ඇතුළත සනීපාරක්ෂක තුවාය පෙඟී යාම)
- ක්ලාන්තය හෝ ඇදවැටීම

හදිසි තත්ත්වයක් තුළ, ඔබට කාර්ය මණ්ඩලය සමග සන්නිවේදන කටයුතු කිරීමට දුරකථන භාෂණ පරිවර්තනය යොදා ගත හැකි ය.
ඔබ සති 12 හෝ ඊට වැඩි ගැබිණියක් නම් සහ රුධිර වහනය හෝ වේදනාව අත් විඳින්නේ නම්, හෝ ඉහත සඳහන් කිසියම් හෝ රෝග ලක්ෂණයක් සහිත වන්නේ නම්, ඔබ ඔබේ ගැබිණි කාලය සඳහා වෙන් කරගන්නා ලද රෝහලේ මාතෘ ඇගයීම් තක්සේරු ඒකකයට දුරකථනයෙන් ඇමතිය යුතු ය.

| | |
|---|---|
| Queen Elizabeth University Hospital | **0141 232 4363** |
| Princess Royal Maternity Hospital | **0141 211 3453/3454** |
| Royal Alexandra Hospital | **0141 314 6067** |
| Vale of Leven Hospital පෙ.ව 8- ප.ව.8* | **01389 817 411** |
| Inverclyde Royal Hospital පෙ.ව 8- ප.ව.8* | **01475 504 619** |
| *වැඩ කරන වේලාවෙන් පිටත ඇමතුම් සඳහා ඔස්සේ Royal Alexandra Hospital අමතන්න | **0141 314 6067** |

මෙම ඕනෑම දුරකථන අංකයක් ඇමතීමට ඔබට දුරකථන භාෂණ පරිවර්තන සේවාව භාවිතා කළ හැකි ය.